# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - අප්‍රේල් මාසය - 3 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශක :- බන්දුප්‍රේම ඕපනායක

- බුදු හාමුදුරුවෝ කාටත් කරුණාවන්තයි.
- අසරණ වූ අයට නිතරම පිහිට වුනා.
- ඒ වගේ අසරණ වූ දරුවෙක් තමයි සෝපාක කියන්නෙ.
- එයාට අපට වගේ අම්මගේ තාත්තගේ ආදරය ලැබුණේ නැහැ.
- මේ බව බුදු හාමුදුරුවෝ දැනගෙන ඒ චූටි ළමයට පිහිට වුනා.
- බුදු හාමුදුරුවෝ සෝපාක හිටිය තැනට ගියා.
- ආදරයෙන් කතා කළා.
- සෝපාකත් අඩමින් විස්තර කිව්වා.
- ඊට පස්සෙ සෝපාකව කැදවාගෙන ගිහින් මහණ කළා.
- මෙන්න මේ කවිය ගායනා කරන්කෝ.

මව්පිය සෙනෙහස අහිමිව
සිටියා සොහොනක තනිවම
සෝපාකට පිහිට ලැබුණෙ
බුදු කරුණා ගුණ මහිමෙන.

- පුතේ අපිත් අසරණ වූ අයට පිහිට වෙමු.
- තවත් මේ වගේ කතාවක් ඔයාලගෙ පෙළ පොතේ 15 පාඩමේ තිබෙනවා. එයත් කියවා ගන්න.

**“හොදයි ආදරණිය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”**